# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,419 - 2024 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2025.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 18 | පළාත් පාලනන සහා ඡන්ද ආඥාපනත යටෙත් දැන්වීම්... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබ්‍රද ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — | අයවැය ලේඛන ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 22 | දේපළ විකිණීම් ... ... | 23 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | විවිධ දැන්වීම් | |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්පකුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

17 - B 082645 — 5,403 (2025/01)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## විල්ගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයේ ආයතනගත තනතුරු පුරප්පාඩු පිරවීම

1. විල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. පුරප්පාඩු පවතින තනතුරු

| *අනු අංකය* | *තනතුරු* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 02 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |
| 02 | සෞඛ්‍ය කම්කරු | 02 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |
| 03 | රියදුරු | 01 | දෛනික වැටුප් ගෙවීමේ පදනම මත |

3. **උක්ත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම් :**

1.1 අධ්‍යාපන සුදුසුකම් -

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වසරක දී සමත් වී තිබිය යුතුයි.

1.2 කායික සුදුසුකම් -

සෑම අපේක්ෂකයෙකු ම මනා ඇස් පෙනීමක් හා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර බල ප්‍රදේශයේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

1.3 වෙනත් -

i. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

ii. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් - එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-45 ත් අතර විය යුතුය. (අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

රියදුරු තනතුර සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම් :

v. රියදුරු සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය - ( D කාණ්ඩයේ රියදුරු බලපත්‍රයක් විය යුතුය.)

vi. එය අවුරුදු 03 කට පෙර ලබාගත් එකක් විය යුතුය.

vii. ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

viii. පෙර සේවය කර ඇත්නම් එම ආයතන මගින් ලබා ගත් සහතික

සටහන - පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පළමුව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනීම කළ යුතුය. අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුස්සන් ප්‍රමාණවත් නොවූ විටෙක යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම කළ හැකිය.

4. බඳවා ගැනීමේ ක්‍රමය :

4.1 බඳවා ගන්නා ප්‍රතිශතය

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | අදාළ නොවේ |

4.2 බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩු වලට පත් කරනු ලැබේ.

4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය (100%)* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. ඉහළම ලකුණු ලබාගත් ඉල්ලුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරාගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

(පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ දී අදාළ පළාත් පාලන ආයතනයේ දැනට සේවයේ නියුතු අය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දිය හැක.)

5. වෙනත් පොදු සුදුසුකම් -

5.1 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

5.2 රජයේ/පළාත් පාලන/සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙක් හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

6. අයදුම්පත් ඉදිරිපත් කිරීම -

6.1 අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් **2025.01.24** වැනි දිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, විල්ගමුව" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

6.2 අයදුම්පත් බහාලනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

6.3 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම සාමදාන විනිශ්චයකාරවරයෙකු/ග්‍රාම නිලධාරියකු/ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

6.4 අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- අධ්‍යාපන සහතිකය
- ජාතික හැඳුනුම්පත
- පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය
- මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (ඉන් 01 ක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.)
- වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික
- සේවා සහතිකය

6.5 අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන සහතිකවල මුල් පිටපත් පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු වේ.

**සැලකිය යුතුයි :**

දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත එවිය යුතුය.

ආර්. ඩබ්. ඩබ්. සුදර්ශනී,
ලේකම්,
විල්ගමුව ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 28 වැනි දින,
විල්ගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ආයතනගත තනතුරු සඳහා බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :……………………………………………………………………………
02. ස්ථිර ලිපිනය :……………………………………………………………………………
03. උපන් දිනය :……………………………………………………………………………
04. ජාතික හැඳුනුම්පත් අංකය :……………………………………………………………………………
05. තනතුර :……………………………………………………………………………
06. දුරකථන අංකය :……………………………………………………………………………
07. ස්ත්‍රී/පුරුෂභාවය :……………………………………………………………………………
08. අධ්‍යාපන සුදුසුකම්

* අ.පො.ස. (සා.පෙළ) විභාගය **:**

පළමු වර

| *විෂයය* | *සාමාර්ථය* | *සංකේත අංකය* |
|---|---|---|
| | | |

දෙවන වර

| *විෂයය* | *සාමාර්ථය* | *සංකේත අංකය* |
|---|---|---|
| | | |

* අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| විෂයය | සාමාර්ථය | සංකේත අංකය |
|---|---|---|
| | | |

09. වෙනත් සුදුසුකම් :………………………………………………………………………………

10. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

…………………………
අයදුම්කරුගේ අත්සන.

දිනය :…………………………

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..............................................(ලිපිනය) හි පදිංචි.......................................................... (නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත්. සහතික කරමි.

.......................................
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :…………………………

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :…………………………………………
තනතුර :………………………………………
ලිපිනය :………………………………………

12. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම ඉල්ලුම්කරුවන් ..............................................................(නම) යන අය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ..........................................(තනතුර) වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

…………………………………
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :……………………

01-44

# පළාත් පාලන නිවේදන

## බියගම ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 2005.02.18 දිනැති අංක 1381 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV (අ) කොටසේ පළ කරන ලද ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව බියගම ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල සඳහා ක්‍රියාත්මක කිරීමට 2024.10.29 දිනැති සභා තීරණ අංක 29/372 යටතේ තීරණය කරන ලද බව ද, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව බියගම ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල සඳහා ක්‍රියාත්මක වන බව ද මෙයින් දැනුම් දෙමි.

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම්,
බියගම ප්‍රාදේශීය සභාව.

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
බියගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-55

---

## අම්බලන්තොට ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ බලතල ප්‍රකාරව අම්බලන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2024 වර්ෂයේ දෙසැම්බර් මස 20 වැනි දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශ අංක 01 යටතේ පහත සඳහන් නිර්දේශ අනුමත කොට අම්බලන්තොට ප්‍රාදේශීය සභා ලේකම්තුමිය විසින් තීරණ අංක APS/2024/12/20/40 යටතේ පිළිගෙන සම්මත කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ඒ. නදීකා දිල්හානි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව අම්බලන්තොට.

2024 දෙසැම්බර් මස 20 වැනි දින,
අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ දී ය.

### තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත හා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 6 යටතේ දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් දකුණු පළාත් සභාවේ පළාත් විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර ඇමතිතුමා විසින් සාදනු ලැබ 2013 මැයි මස 17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(අ) කොටසේ පළකරනලද්දා වූ දකුණු පළාත් සභාව විසින් අනුමත කර 2014.08.29 වැනි දින අංක 1978 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(අ) කොටසේ පළ කරන ලද්දා වූ 1 වැනි කොටස සිට XXIX වැනි කොටස දක්වා වූ අතුරු ව්‍යවස්ථා අතරින් පහත උපලේඛනයේ සඳහන් අතුරු ව්‍යවස්ථාව අම්බලන්තොට ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන පිළිගැනීමට එකී අතුරු ව්‍යවස්ථා 2025 ජනවාරි මස 01 වැනි දින සිට අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශය තුළ ක්‍රියාත්මක විය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියේ බලතල ප්‍රකාරව අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් හා කාර්ය කර්තව්‍ය ඉටුකිරීමේ නිලධාරී වන මා විසින් තීරණය කරමි.

### උපලේඛනය

XXIII වැනි කොටස

ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

01-64

# විවිධ දැන්වීම්

## මහනුවර මහා නගර සභාව

**මහනුවර මහා නගර සභාව සතු අනුමත වීදිවල නවතා තබන රථ වාහන වලින් අය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පැනවීම**

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ අංක 267 හා 272 දරන වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව මහනුවර මහා නගර සභාව විසින් 2002.08.09 වැනි දින අංක 1249 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(අ) වැනි කොටසේ පළ කරන ලද මහනුවර මහා නගර සභාවේ අතුරු ව්‍යවස්ථා මාලාවේ III වන කොටස යටතේ කියැවෙන වාහන නතර කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි 2024.05.31 වැනි දින අංක 1271 දරන තීරණයෙන් අනුමත කොට ඇති පහත සඳහන් වීදිවල නවත්වනු ලබන රථ වාහන වලින් පහත සඳහන් ගාස්තු 2025.01.16 දින සිට අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2024 දෙසැම්බර් මස 30 වැනි දින,
මහනුවර මහා නගර සභා කාර්යාලයේ දී ය.

**ගාස්තු අය කිරීම සඳහා අනුමත වේලාව - පෙ. ව. 5.00 සිට ප.ව. 7.00 දක්වා**

**රථවාහන නවතා තැබීමට අනුමත වීදීන් -**

01. රජ වීදිය (45 degrees Angle parking)
    1. ඇහැලේපොල වලව්වේ සිට වරිපනම් අංක 68 දරන පැවිලියන් හෝටලය දක්වා

02. දේව වීදිය (Angle parking)
    1. වරිපනම් අංක 15 දරන ලකී කැෆේ සිට වරිපනම් අංක 14 දරන Heritage Boutique හෝටලය දක්වා

03. මහනුවර සංඝරාජ මාවතේ අනගාරික ධර්මපාල මාවත සම්බන්ධ කරන වීර මද්දුම බණ්ඩාර මාවතට හැරෙන හන්දියේ සිට අවන්හල ඉදිරිපිට දක්වා (90 degrees Angle parking)

අනුමත ගාස්තු -

| | *යතුරු පැදි* | | *ත්‍රීරෝද රථ* | | *මෝටර් රථ, කැබ් රථ, වෑන් රථ, ජීප් රථ* | | *බස් රථ, ලොරි රථ, ට්‍රක් රථ* | |
|---|---|---|---|---|---|---|---|---|
| | *පැයක ගාස්තුව රු. ශත* | *අයකළ යුතු මුදල රු. ශත* | *පැයක ගාස්තුව රු. ශත* | *අයකළ යුතු මුදල රු. ශත* | *පැයක ගාස්තුව රු. ශත* | *අයකළ යුතු මුදල රු. ශත* | *පැයක ගාස්තුව රු. ශත* | *අයකළ යුතු මුදල රු. ශත* |
| 1 වන පැය | 30.00 | 30.00 | 60.00 | 60 | 80.00 | 80.00 | 100.00 | 100.00 |
| 2 වන පැය | 20.00 | 50.00 | 50.00 | 110.00 | 100.00 | 180.00 | 100.00 | 200.00 |
| 3 වන පැය | 20.00 | 70.00 | 50.00 | 160.00 | 100.00 | 280.00 | 150.00 | 350.00 |

| | යතුරු පැදි | | ත්‍රිරෝද රථ | | මෝටර් රථ, කැබ් රථ, වෑන් රථ, ජීප් රථ | | බස් රථ, ලොරි රථ, ට්‍රක් රථ | |
|---|---|---|---|---|---|---|---|---|
| | පැයක ගාස්තුව රු. ශත | අයකළ යුතු මුදල රු. ශත | පැයක ගාස්තුව රු. ශත | අයකළ යුතු මුදල රු. ශත | පැයක ගාස්තුව රු. ශත | අයකළ යුතු මුදල රු. ශත | පැයක ගාස්තුව රු. ශත | අයකළ යුතු මුදල රු. ශත |
| 4 වන පැය | 20.00 | 90.00 | 50.00 | 210.00 | 100.00 | 380.00 | 150.00 | 500.00 |
| 5 වන පැය | 20.00 | 110.00 | 50.00 | 260.00 | 70.00 | 450.00 | 200.00 | 700.00 |
| 6 වන පැය | 20.00 | 130.00 | 50.00 | 310.00 | 70.00 | 520.00 | 200.00 | 900.00 |
| 7 වන පැය | 20.00 | 150.00 | 50.00 | 360.00 | 70.00 | 590.00 | 200.00 | 1,100.00 |
| 8 වන පැය | 20.00 | 170.00 | 50.00 | 410.00 | 70.00 | 660.00 | 200.00 | 1,300.00 |
| 9 වන පැය | 20.00 | 190.00 | 50.00 | 460.00 | 70.00 | 730.00 | 200.00 | 1,500.00 |
| 10 වන පැය | 20.00 | 210.00 | 50.00 | 510.00 | 50.00 | 780.00 | 200.00 | 1,700.00 |
| 11 වන පැය | 20.00 | 230.00 | 50.00 | 560.00 | 50.00 | 830.00 | 200.00 | 1,900.00 |
| 12 වන පැය | 20.00 | 250.00 | 50.00 | 610.00 | 50.00 | 880.00 | 200.00 | 2,100.00 |
| 13 වන පැය | 20.00 | 270.00 | 50.00 | 660.00 | 50.00 | 930.00 | 200.00 | 2,300.0 |
| 14 වන පැය | 20.00 | 290.00 | 50.00 | 710.00 | 50.00 | 980.00 | 200.00 | 2,500.00 |

01-40